**ශීර්ෂය - 323 - නීති කටයුතු දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

නීති කටයුතු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 අප්‍රේල් 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නීති කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018අංක 19දරන ජාතික විගණන පනතේ ) (1)6ඇ (වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි .

)අ( මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

)ආ( ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ .

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අංක PFD/RED/REG/02/CC/2022 හා 2022 මැයි 26 දිනැති ලිපියේ I ඡේදය, 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 චක්‍රලේඛයේ 10 ඡේදය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ද ඉදිරිපත් කළ යුතු වුවද, නීති කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඉහත චක්‍රලේඛ හා පනතේ විධිවිධාන පරිදි, වාර්ෂික කාර්යසාධන වාර්තාව 2023 පෙබරවාරි 28 දින වන විට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බවත්, 2022 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් 2023.04.03 දින ඉදිරිපත් කර ඇති බවත් දක්වා තිබුණි. | විගණන පනත හා අනෙකුත් චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2021 ජුනි 10 - ජුනි 18 අතර කාලපරිච්ඡේදය තුළ අස්ථානගත වූ ලැප්ටොප් පරිගණකයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1), 104(3) හා 104(4) ප්‍රකාරව වූ පරීක්ෂණ කටයුතු කාලීනව සිදු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බවත්, මෙම දෙපාර්තමේන්තුවට අයත් S/N 8HDJ4C2 - DELL LAPTOP පරිගණකය නැතිවීම සම්බන්ධයෙන් මු.රෙ 104(1) (අ) අනුව සිදු කරන ලද නැති වීම | රජයේ මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කර අලාභය අය කර ගැනීමට කඩිනම්ව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | පිළිබඳ පරීක්ෂණය සහ ඊට වගකිව යුත්තන් නිශ්චය කිරීම සම්බන්ධයෙන් පත්කරන ලද කමිටුවේ නිර්දේශ අනුව මෙම ලැප්ටොප් පරිගණක යන්ත්‍රය අස්ථානගතවීම සම්බන්ධයෙන් වගකිවයුත්තන් තීරණය කිරීම මූලික වශයෙන් විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගෙන සිදු කරනු ලබන පොලිස් විමර්ශනයට අනුකූල විය යුතු බැවින්, මෙම කරුණට අදාල විමර්ශන ප්‍රගතිය පිළිබඳ කරුණු ලබාදෙන ලෙස කොටුව පොලිස් ස්ථානයට ලිපියක් යවා ඇති බවත් දක්වා තිබුණි. | |

**.3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

පහත කරුණු නිරීක්ෂණය කෙරේ .

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 හා 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත විය යුතු බවට දක්වා ඇති වර්ෂයට අදාළ යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය සහ වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම යන කරුණු නීති කටයුතු දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී වැඩි ප්‍රමුඛතාවයක් යොමු කර ඇත්තේ නීතිමය කටයුතු සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් කිරීමට බවත්,<br>• ඉදිරි වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී වර්ෂයට අදාළ යාවත්කාලීන කළ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ද,<br>• වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ද ඇතුළත් කිරීමට කටයුතු කරන බවත් දක්වා තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු විම. |

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ දක්වා ඇති වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට නියමිත ආකෘති පත්‍රය ප්‍රකාරව වගකීම් ක්ෂේත්‍රය, වගකිව යුතු නිලධාරියා හා කාලපරිච්ඡේදය (ජනවාරි සිට දෙසැම්බර් දක්වා) ආදී විස්තර ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වුවද, නීති කටයුතු දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී අදාළ ආකෘතිය ප්‍රකාරව සකස් කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් අයවැය හා සම්බන්ධ මූල්‍ය වැය බරක් දරණ ක්‍රියාකාරකම් නොවන අතර නඩු විසඳීම සහ පනත් හඳුන්වාදීම වැනි මූල්‍ය නොවන ක්‍රියාකාරකම් බවත්, ඒවා රා.මු.ව 02/2020 චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශයේ (ආ) යටතට ඇතුළත් කිරීම අපහසු බවත්, එම නිසා දෙපාර්තමේන්තුව විසින් සකස් කර ගත් ආකෘති පත්‍රයකට අනුව ක්‍රියාකාරකම් ඇතුළත් කර ක්‍රියාත්මක කරනු ලබන කාල රාමුව ද සඳහන් කර ඇති බවත් දක්වා තිබුණි. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි දෙපාර්තමේන්තුවට සුදුසු ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරිම

පහත කරුණු නිරීක්ෂණය කෙරේ .

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 හා 2022 වර්ෂ තුළදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බවට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගතව තිබූ පහත සඳහන් පනත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.<br><br>• 1951 අංක 38 දරන ලෝහෝර් ආයී ණය අරමුදල් පනත<br>• කොළඹ කොටස් හුවමාරුව අසාමුහිකරණ කිරීමේ පනත<br>• සුරක්ෂිතලත් ගණුදෙනු පනත<br>• දේශීය භාර ලදුපත් ආඥාපනත<br>• ලියාපදිංචි ස්කන්ධ හා සුරකුම් ආඥා පනත<br>• 2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමණාකරණ ගණකාධිකාරී ආයතන පනත<br>• ශ්‍රම වාසනා අරමුදල් පනත | පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම රජයේ ප්‍රතිපත්තිමය තීරණයන් අනුව කරනු ලබන්නක් වන බැවින් ඇතැම් පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොලැබිණි. එසේම පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය ඊට අදාළ වන ආයතන ගණනාවක සහයෝගයෙන් සිදු කළ යුත්තක් වන බවත්, එය දෙපාර්තමේන්තුවේ කැමැත්ත මත පමණක් රඳා නොපවතින බවත්, එසේම ගරු ජනාධිපතිවරයාගේ බලතල ප්‍රකාරව එක් එක් ආයතන විටින් විට අමාත්‍යාංශ යටතේ ගැසට් කර ඇති බැවින් අප විසින් ආරම්භ කරන ලද ඇතැම් පනත් කෙටුම්පත් වෙනත් අමාත්‍යාංශ වෙත යොමු කිරීමට සිදු වීම හේතුවෙන් එම පනත් අවසන් කිරීමේ කාර්යභාරය දෙපාර්තමේන්තුව වෙත නොපැවරෙන බවත් දක්වා තිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත කරුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සංශෝධනයන් සිදු කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බවට 2021 සහ 2022 වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් තුළ අන්තර්ගත කර තිබූ පහත සඳහන් පනත් 09 ට අදාළ සංශෝධනයන් 2022 දෙසැම්බර් 31 දින වන විටත් සිදු කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි.<br>• 2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණ වැලැක්වීමේ පනතට සංශෝධන<br>• 2006 අංක 06 දරන මුදල් ගණුදෙනු වාර්තා කිරීමේ පනතට සංශෝධන<br>• 2005 අංක 25 දරන ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතට සංශෝධන<br>• ලංකා බැංකු ආඥා පනතට සංශෝධන<br>• සමාගම් පනතට සංශෝධන<br>• 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට සංශෝධන<br>• 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) සංශෝධන පනත්කෙටුම්පත<br>• 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත පනත සංශෝධන<br>• 1990 අංක 02 දරන ණය අයකර ගැනීමේ (විශේෂ විධාන) පනත සංශෝධන | පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම රජයේ ප්‍රතිපත්තිමය තීරණයන් අනුව කරනු ලබන්නක් වන බැවින් ඇතැම් පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොලැබිණි. එසේම පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය ඊට අදාළ වන ආයතන ගණනාවක සහයෝගයෙන් සිදු කළ යුත්තක් වන බවත්, එය දෙපාර්තමේන්තුවේ කැමැත්ත මත පමණක් රඳා නොපවතින බවත්, එසේම ගරු ජනාධිපතිවරයාගේ බලතල ප්‍රකාරව එක් එක් ආයතන විටින් විට අමාත්‍යාංශ යටතේ ගැසට් කර ඇති බැවින් අප විසින් ආරම්භ කරන ලද ඇතැම් පනත් කෙටුම්පත් වෙනත් අමාත්‍යාංශ වෙත යොමු කිරීමට සිදු වීම හේතුවෙන් එම පනත් අවසන් කිරීමේ කාර්යභාරය දෙපාර්තමේන්තුව වෙත නොපැවරෙන බවත් දක්වා තිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත කරුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2021 හා 2022 වර්ෂවල වාර්ෂික ක්‍රියාකාරී සැලැසුම් අනුව ණය නියාමක අධිකාරිය ස්ථාපිත කළ යුතු බවට අන්තර්ගත කර තිබුණද 2022 දෙසැම්බර් 31 දින වන විටත් එම අධිකාරිය ස්ථාපිත කර නොතිබුණි. එම අධිකාරිය ස්ථාපිත කිරීමට අදාල අවසන් ලේඛන පරීක්ෂා කරමින් පවතින බවත් සති 02 ක් තුළ එය | ණය නියාමන අධිකාරිය ස්ථාපිත කිරීම අතිශය සංකීර්ණ විෂයක් වන අතර මේ වන විට එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන් මාලාවට ඇතුළත් කිරීමට ද පියවර ගෙන ඇත. ඒ සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහයෝගය ද ලබා ගැනිමට කටයුතු කර ඇති බවත්, 2021 වර්ෂයේ දී | යෝජිත ක්‍රියාකාරකම කඩිනමින් නිම කිරීමට පියවර ගත යුතු විම. |

| | | |
|---|---|---|
| අවසන් කිරීමට නියමිත බවත් 2022 ජුනි 06 දින විගණන විමසුම්වලට පිළිතුරු ලෙස දන්වා තිබුණද එම කටයුතු 2023 මාර්තු දක්වාත් නිම කර නොතිබුණි. | ණය නියාමන අධිකාරිය ස්ථාපනය කිරීම ප්‍රමාද වීමට හේතු වූයේ එම පනතේ ඇති සංකීර්ණ ස්වාභාවය හා තාක්ෂණික සහයෝගය සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ රජය අවසන් එකඟතාවයකට පැමිණ නොතිබූ බවත් දක්වා තිබුණි. | |
| (ඇ) නීති කටයුතු දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට අවසන් කර නොමැති නඩු සංඛ්‍යාව 381 ක් වූ අතර, 2022 වර්ෂය තුළදී ලැබී ඇති නඩු සංඛ්‍යාව 77 කි. ඉන් නඩු 06 ක් 2022 වර්ෂය තුළ විසඳී ඇති අතර, 2022 දෙසැම්බර් 31 දින වන විට අවසන් නොමැති නඩු සංඛ්‍යාව 452 ක් විය. | විගණනයේ නිරීක්ෂණ සමඟ එකඟ වන බව දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුවට ලැබෙන නඩුවල වැඩ කටයුතු නිම කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් කළ යුතු වීම. |
| (ඉ) නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගැනීමට හා නීති කටයුතු දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සඳහා ලැබී ඇති ලිපිගොනුවලින් ලිපිගොනු 09 ක වැඩකටයුතු 2022 දෙසැම්බර් 31 දිනට අවසන් වී නොතිබුණි. | විගණනයේ නිරීක්ෂණ සමඟ එකඟ වන බව දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා දීම කඩිනම් කළ යුතු වීම. |

**4. මානව සම්පත් කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් රාජ්‍ය ආයතනවල මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම හා කටයුතු කළයුතු ආකාරය පිළිබඳ ලබා දි ඇති උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම හා ආයතනයට සුවිශේෂී මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධව විගණනයේ නිරීක්ෂණ සමඟ එකඟ වන බවත්, අදාළ විෂය භාර මාණ්ඩලික නිලධාරීන් ස්ථාන මාරු ලබා යාම, පසුව 2020 වසරේ සිට රටේ පැවති කොරෝනා වසංගතය හා තෙල් අර්බුදය වැනි අවස්ථානුගත කරුණු හේතුවෙන් සේවකයින්ගේ අඛණ්ඩ පැමිණීමේ පැවති ගැටළු හා පුහුණුවීම් සඳහා සහභාගී වීමේ දුෂ්කරතා මත මෙම චක්‍රලේඛය අනුව මූලික කටයුතු සිදුකර ඇතත් එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත් දක්වා තිබුණි. | |

| | | | |
|---|---|---|---|
| (i) | ඉහත චක්‍රලේඛයේ ඡේද අංක 01 ප්‍රකාරව, කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් 2018 වර්ෂයේ සිට අත්සන් කළ යුතු බවට දක්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | කෙසේ නමුත් සියලුම නිලධාරීන් සඳහා සිය සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් සම්පූර්ණ කළ යුතු පුහුණුවීම් සඳහා සෑම විටම ප්‍රමුඛ අවස්ථාව හිමිකර දී ඇත. වෙනත් අවස්ථාන්හිදී ද අදාළ සේවකයින්ගේ ඉල්ලීම මත අවශ්‍ය පුහුණුවීම් ලබාදීමට කටයුතු කර ඇති බවත්, දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන දේශීය වැඩමුළු සහ මාර්ගගත විදේශ වැඩමුළු සඳහා යොමු කරවීම ද නිරන්තරයෙන් රජයට වැය බරක් නොවන පරිදි සිදු කර ඇති බවත් දක්වා තිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපදෙස් පරිදි වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කළ යුතු වීම. |
| (ii) | චක්‍රලේඛයේ ඡේද 04 ප්‍රකාරව, නිපුණතා පරතරය අවම කිරීම සඳහා ආයතනයට සුවිශේෂ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් එවැනි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම හා ආයතනයට සුවිශේෂී මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධව විගණනයේ නිරීක්ෂණ සමඟ එකඟ වන බවත්, අදාළ විෂය භාර මාණ්ඩලික නිලධාරීන් ස්ථාන මාරු ලබා යාම, පසුව 2020 වසරේ සිට රටේ පැවති කොරෝනා වසංගතය හා තෙල් අර්බුදය වැනි අවස්ථානුගත කරුණු හේතුවෙන් සේවකයින්ගේ අඛණ්ඩ පැමිණීමේ පැවති ගැටළු හා පුහුණුවීම් සඳහා සහභාගී වීමේ දුෂ්කරතා මත මෙම චක්‍රලේඛය අනුව මූලික කටයුතු සිදුකර ඇතත් එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත් දක්වා තිබුණි.<br>කෙසේ නමුත් සියලුම නිලධාරීන් සඳහා සිය සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් සම්පූර්ණ කළ යුතු පුහුණුවීම් සඳහා සෑම විටම ප්‍රමුඛ අවස්ථාව හිමිකර දී ඇත. වෙනත් අවස්ථාන්හිදී ද අදාළ සේවකයින්ගේ ඉල්ලීම මත අවශ්‍ය පුහුණුවීම් ලබාදීමට කටයුතු කර ඇති බවත්, දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන දේශීය වැඩමුළු සහ මාර්ගගත විදේශ වැඩමුළු සඳහා යොමු කරවීම ද නිරන්තරයෙන් රජයට වැය බරක් නොවන පරිදි සිදු කර ඇති බවත් දක්වා තිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපදෙස් පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කළ යුතු වීම. |

(ආ) අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 22 ක් වූ අතර, ඉන් තනතුරු 07 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු අතර, ජ්‍යෙෂ්ඨ මටට්ටමේ තනතුරු 05 ක් විය. | • පුරප්පාඩුව පවතින තනතුරු 07න් අධ්‍යක්ෂ ජනරාල් තනතුර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ යුතු තනතුරකි. අමාත්‍ය මණ්ඩලය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කළ අවස්ථාවක දී පුරප්පාඩුව පවතින සෙසු රියදුරු තනතුර පිරවීමට කටයුතු කරනු ලැබේ.<br>• පුරප්පාඩුව පවතින ඉතිරි ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 තනතුර සඳහා හා ද්විතියික මට්ටමේ තනතුර සඳහා පත්කිරීම් සිදු කිරීමට කටයුතු සිදු කර දෙන ලෙස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. | විධිමත් අනුමැතීන්ට යටත්ව කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |